**සීතාවක ප්‍රාදේශීය සභාව - 2022**
**---------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සීතාවක ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට සීතාවක ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

**2018** අංක **19** දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) **2018** අංක **19** දරණ ජාතික විගණන පනතේ **6 (1) (ඈ)** (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය - 2017 අනුව මූල්‍ය ප්‍රකාශනවල පහත සඳහන් කරුණු හෙළිදරව් කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක 2155 /8 හා 2019 දෙසැම්බර් 24 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් පනවා ඇති ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබඳ රීති අංක 99 ට ආදාළව මූල්‍ය ප්‍රකාශන වල අයවැය ගත තොරතුරු, එනම් මුල් අයවැය අවසාන අයවැය සහ ඒ අතර ප්‍රමාණාත්මක වෙනස්වීම් ඇත්නම් ඒවාට හේතු හෙළිදරව් කිරීම් ආදිය සිදුකර නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | අයවැය ගත ශේෂ වෙනස්වීමට හේතු හෙළිදරව් කළ යුතුය. |
| (ආ) | වෙනත් විස්තීර්ණ ආදායම් තුළ ඇති, අයභාරවල තෘප්ත නොකරන රජයෙන් වන පැවරුම් ස්කන්ධයේ වෙනම සංරචක ලෙස වත්කම් හා වගකීම් ප්‍රකාශයේ පෙන්විය යුතු වුවද එම වත්කම් හදුනාගෙන ගිණුම් ගතකර නොතිබුණි. | 2021,2022 වර්ෂ දෙකෙහි පාලම් , බෝක්කු ,මංමාවත් වෙනුවෙන් වියදම් කළ මුදල් වෙන වෙනම හඳුනාගත නොහැකි වූ බැවින් ස්කන්ධයේ වෙනම සංරචකයක් ලෙස වත්කම් හා වගකීම් ප්‍රකාශනයේ නොපෙන්වූ අතර 2023 වර්ෂයේ අදාල නිවැරදි කිරීම් සිදු කරන බව. | වත්කම් නිවරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | 2019 දෙසැම්බර් 24 දිනැති අංක 2155/8 අති විශේෂ ගැසට් නිවේදනයේ iv (අ) කොටසේ 227 වැනි රීතියේ vi වැනි උප වගන්තිය ප්‍රකාර ලියාහැරීම් අනුමත කළ අධිකාරිය සහ කාලපරිච්ඡේදය තුලදී අයකරගත නොහැකි ලෙස හුවමාරු ගණුදෙනු වලින් වන ලැබිය යුතු දැ ලියා හැරීම් වල වටිනාකම පොදුවේ හෙළිදරව් කල යුතු වුවත් සභාව විසින් අනුමත නොකරන ලද සමාලෝචිත වර්ෂය අවසානයට කපා හරින ලද ශේෂවල එකතු වටිනාකම රු. 27,365,435 ක් ඉවත් කිරීම සඳහා අනුමත කිරීම් හෙළිදරව් කර නොතිබුණි. | රු.26,609,446 ක් වූ ණයහිමියන් සහ රු.755,989ක විමධ්‍යගත ආධාර මුදල ඉවත් කිරීම සඳහා මහ සභා අනුමැතිය ලබා ගෙන නොමැති අතර ඉදිරියේදී එසේ කටයුතු කරන බව. | ශේෂ ලියාහැරීම පොදුවේ හෙළිදරව් කළ යුතුය. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජර්නල් සටහන් 15-2022 ට ආදාල ගොඩනැගිලි ගිණුම (ප්‍රාග්ධන වත්කම්) රු.10,811,089 ක් හර ලෙස දක්වා තිබුණද ලෙජරයේ එම ගිණුමෙහි දක්වා තිබුණේ රු.6,223,089 ක් පමණි. | 2023.12.31 අවසන් ගිණුම් වර්ෂයේදී නිවැරදි කරන බව. | වටිනාකම නිවරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි ශේෂය තුළ කෙරිගෙන යන වැඩ සඳහා ගෙවා තිබූ රු.5,229,822 ක් ගිණුම් ගත කර තිබුණි. | -එම- | වත්කම් නිවරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයේ හිගහිටි වරිපනම් වටිනාකම රු.2,454,871 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | -එම- | ලැබියයුතු වරිපනම් ශේෂය නිවරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයේ කලින් ලද වරිපනම් ආදායම රු.208,300 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | වරිපනම් ආදායම නිවරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයේ ලැබිය යුතු කඩකුලි රු.468,614 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | කඩ කුලී ආදායම නිවරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හුවමාරු ගණුදෙනු අයභාරය රු.1,017,457 ක් හා හුවමාරු ගණුදෙනු වලින් ලැබිය යුතු ශේෂය රු.1,038,648 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | ස්ථාවර තැන්පතු සඳහා පොළී ආදායම නිවරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | ජර්නල් සටහන් 15-2022 අනුව සමාලෝචිත වර්ෂය තුළ මිලදීගත් පරිගණක වටිනාකම රු.301,094 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | -එම- | වත්කම් නිවරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු රු.109,901 ක් වූ බැංකු ණය පොළිය හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | ණය පොළි නිවරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (එ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් ක්ෂය කිරීමේදි සවි කිරීම් රු.595,389 ක් අඩුවෙන්ද, පරිගණක රු.31,237 ක් සහ කාර්යාල උපකරණ රු.14,674 ක් වැඩියෙන්ද ගිණුම්ගත කර තිබුණි. | -එම- | වත්කම් ක්ෂය කිරීම නිවරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) | පූර්ව වර්ෂයට ආදාලව කලින් ලද වරිපනම් තුල ඇති දූන් වට්ටම් රු.180,540 ක් සමාලෝචිත වර්ෂයේ දූන් | -එම- | වට්ටම් නිවරදිව ගිණුම්ගත කළ යුතුය. |

වට්ටම් ගිණුමට ගෙන නොතිබුණි.

| | | | |
|---|---|---|---|
| (ඔ) | 2022 ඔක්තෝබර් මාසයේ පරිපාලන වියදම මූල්‍ය ප්‍රකාශනවල රු.229,697 ක් අඩුවෙන් දක්වා තිබුණි | -එම- | වියදම් නිවරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.6.3** නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයන් 02ට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.31,843,762 ක් වුවද එම උපලේඛන අනුව ශේෂය රු.32,886,504 ක් වූයෙන් ශේෂ අතර රු.1,042,742 ක වෙනසක් විය. | පිළිතුරු ලැබී නැත | නිවරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.7** අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| මුදල් රෙගුලාසි 571 | 2022 දෙසැම්බර් 31 දිනට රු.12,435,723 ක් වටිනා වර්ෂ 03 කට වැඩි විවිධ තැන්පතු නියාදනය කර නොතිබුණි. | 2022.12.31 දිනට තැන්පත් ලේඛණයේ රු.12,435,723ක ශේෂයෙන් 2019.12.31 දක්වා වූ තැන්පත් ශේෂ ආදායමට ගැනීමට අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතින බව. | තැන්පතු ශේෂ ආදායමට ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**2.** මූල්‍ය සමාලෝචනය

**2.1** මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.119,570,029 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.147,778,193 ක් විය.

**2.2** ආදායම් පරිපාලනය

**2.2.1** ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තුගත ආදායම රු. 000 | 2022 බිල් කළ ආදායම රු. 000 | 2022 රැස්කළ ආදායම රු. 000 | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. 000 | 2021 ඇස්තමේන්තුගත ආදායම රු. 000 | 2021 බිල් කළ ආදායම රු. 000 | 2021 රැස්කළ ආදායම රු. 000 | 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. 000 |
|---|---|---|---|---|---|---|---|---|---|
| (i) | වරිපනම් හා බදු | 34,651 | 39837 | 35,977 | 3,860 | 34,482 | 21,937 | 25,264 | 13,259 |
| (ii) | කුලී | 43,300 | 33,031 | 31,924 | 1,107 | 32,439 | 22,344 | 27,019 | 1,175 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,266 | 2,448 | 2,448 | - | 3,167 | 2,347 | 2,689 | - |
| (iv) | වෙනත් ආදායම් | 301,204 | 202,276 | 186,507 | 15769 | 318,803 | 318,803 | 217,266 | |
| | | 382,421 | 277,592 | 256,856 | 20,736 | 388,891 | 365,431 | 272,238 | 14,434 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

**සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පෙර වර්ෂයේ රැස්කළ ආදායම රු.මි.272.2ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රැස්කළ ආදායම රු.මි.256.8 ක් දක්වා රු.මි.15.4කින් අඩු වී තිබුණි. | පිළිතුර ලබා දී නොමැත | සභාව ආදායම් උපරිම කර ගැනීමට උත්සාහ දැරිය යුතුය. |
| (ආ) කුලී | | |
| සමාලෝචිත වර්ෂය අවසන් දිනට හිඟ කඩ කුලී, ආදායම රු.847,320 ක් අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල අය කර ගැනීමට ලිපි මඟින් දැනුවත් කර ඇති බව. | ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු | | |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.70,000,000 ක් හා මුද්දර ගාස්තු රු.241,114,873 ක් විය . | අදාල තොරතුරු උපලේඛන මඟින් ඉදිරිපත් කර ඇති බව. | හිඟ ආදායම් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) ලැබිය යුතු පළාත් සභා විමධ්‍යගත ආධාර | | |
| සමාලෝචිත වර්ෂය අවසන් දිනට ලැබිය යුතු පළාත් සභා හා විමධ්‍යගත ආධාර රු.19,249,118ක් ලැබිය යුතුව පැවතුණි . | 2021.12.31 දින දක්වා ඉටු කරන ලද කර්මාන්ත වෙනුවෙන් ලැබිය යුතු රු.32,838,959 ක මුදලින් 2023.01.01 දින සිට 2023.04.06 දින දක්වා රු.13,589,841 ක් ලැබී ඇති බව. | පළාත් සභා හා විමධ්‍යගත ආධාර මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) WPPE-6879 අංක දරන කැබ් රථය 2022 මැයි මස 09 දින අනතුරට පත්වී තිබීම හේතුවෙන් රු.3,838,000 ක මුදලකට එම රථය අලුත්වැඩියා සිදු කිරීමට පෞද්ගලික ආයතනයට භාර දී තිබූ අතර ඒ සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් රු.3,000,000 ක උපරිමයකට යටත්ව හිමිකම් ගෙවීමට එකගවී තිබුණි. 2022 අගෝස්තු 12 දින අදාල ගරාජය වෙත රු.1,000,000 ක අත්තිකාරම් මුදලක් ගෙවා මාස 9 ක කාලයක් ඉක්මවා තිබුණද එම අළුත්වැඩියාව මෙතෙක් නිම කර නොතිබුණි.අනතුර සිදු වී වර්ෂයක කාලයක් ගත වුවද මු.රෙ.104 (1),(2),(3),(4) වගන්ති ප්‍රකාරව නියමිත කාලපරිච්ඡේදය තුල අදාල පාර්ශ්වයන් වෙත විධිමත් පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | සභාව සතු WPPE - 6879 අංක දරන කැබ් රථය රු.3,838,000 මුදලකට අලුත්වැඩියා කර මාස දෙකක් තුල ආපසු බාරදීමේ එකඟතාවය මත 2022 අගෝස්තු 01 දින N.I.G.මෝටර්ස් ආයතනය වෙත භාර දී තිබේ. මේ සඳහා රු.1,000,000 ක අත්තිකාරම් මුදලක් 2022 අගෝස්තු 12 දින අදාළ ආයතනය වෙත ගෙවා ඇති අතර , ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් ආයතනය රු.3,000,000ක උපරිමයකට යටත්ව හිමිකම් ගෙවීමට තීරණය කර තිබුණි. වරින් වර දැනුවත් කිරීම් කළ ද අලුත්වැඩියා කටයුතු අවසන් කර කැබ් රථය මේ වනවිට සභාවට බාරදී නොතිබූ අතර ආයතනයේ හිමිකරුට එරෙහිව 2023 මාර්තු 31 දින පොලිසියේ පැමිණිල්ලක් ගොනුකර ඇති බව. | එකග වූ පරිදි රථය අළුත්වැඩියා කර අලාභය තක්සේරු කර අදාල පාර්ශවයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරවකටයුතු කළ යුතුවේ. |
| (ආ) සභාව යටතේ ක්‍රියාත්මක වන පුස්තකාල පහක රු.87,554ක් වටිනා පුස්තකාල පොත් 338 ක් 2022 දෙසැම්බර් 31 දිනට අස්ථානගතවී තිබුණි. | 2022.12.31 වන දිනට පුස්තකාල පොත් සමීක්ෂණය අනුව රු. 87,554ක් වටිනා පොත් 338ක් අස්ථානගතවීම් සම්බන්ධව කරන ලද විගණන විමසුම්වලට පිළිතුරු ඉදිරිපත් කර ඇති බව. | අභ්‍යන්තර පාලනය විධිමත් කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 දෙසැම්බර් 31 දිනට ණයහිමි කාල විශ්ලේෂණය අනුව 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ණය ශේෂය රු.39,276,547 ක් විය. | 2021.12.31දක්වා වූ ණයහිමි වශයෙන් වෙන් කර ඇති රු.39,276,547 ක් වූ මුදල 2023 වර්ෂයේදී ගෙවීමට සිදුවිය හැකි බැවින් වෙන් කර ඇති බව . | ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2020 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දක්වා සංවර්ධන කටයුතු සඳහා ලැබුණු රු.167,318,953ක් වටිනා ප්‍රග්ධන ප්‍රදාන වලින් සභාවට අයිති ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකම හඳුනාගැනීමට කටයුතුකර නොතිබුණි. | සභාවට අයත් 2020 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දක්වා සභාව හරහා ලැබුණු රු.167,318,953 ක් වටිනා ප්‍රාග්ධන ප්‍රදානවලින් සභාවට අයිති ප්‍රාග්ධන ප්‍රදාන ප්‍රමාණය හඳුනාගෙන 2023 වර්ෂයේ ගිණුම් පිළියෙළ කිරීමේදී ගිණුම්වලට ගලපන බව. | ප්‍රාග්ධන ප්‍රදාන හඳුනාගෙන ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පාදුක්ක පොදු ක්‍රීඩාංගන භූමියේ භෞතික භුක්තිය 2011 පෙබරවාරි 24 දින නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රාදේශීය සභාව වෙත භාරදී තිබුණද වර්ෂ 11 ක් ගතවී ඇතත් එහි පූර්ණ හිමිකාරිත්වය මෙතෙක් සභාව වෙත ලබාගෙන නොතිබුණි. | ක්‍රීඩාංගනයේ පූර්ණ අයිතිය සභාව වෙත පවරා දෙන ලෙස ඉල්ලීම් කළද මෙතෙක් එය සිදු වී නොමැත. සභාව විසින් ක්‍රීඩාංගනය නඩත්තු කරන අතර කුලියට දීම මගින් ආදායම් ලබා ගැනීම සිදු කරන බව. | පවරා ගැනීම් කටයුතු කඩිනම් කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේදී අඩු ආදායම්ලාභී පවුල් සඳහා වැසිකිළි ආධාර දීමට රු.2,000,000 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණද ඒ සඳහා වියදම් කර තිබුණේ රු.270,000 ක් පමණි. | භාණ්ඩ මිල ගණන් ඉහළ යාම නිසා භාණ්ඩ මිලදී ගැනීමට වෙන්කරන ලද මුදල් ප්‍රමාණවත් නොවූ බව. | අරමුණුගත කාර්යය නිමකිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සැලැස්මේ විවිධ කර්තව්‍යයන් 04 ක් සඳහා රු.7,600,000 ප්‍රතිපාදනයක් සලසා තිබුණද සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා වැය කර තිබුණේ රු.2,513,469 ක් පමණක් වූ අතර එහි මූල්‍ය ප්‍රගතිය සියයට 33 ක් විය. | පුහුණු වැඩමුළු අඩුවෙන් පැවැත්වීමත්, සායන සඳහා මව්වරුන්ගේ පැමිණීම අඩු වීමත්, වියදම් සීමා කිරීමේ චක්‍රලේඛය අනුව කටයුතු කිරීමත් හා කොරෝනා උවදුර අවම වීම නිසා බෙහෙත් කට්ටල බෙදා නොදීම මත වියදම් ඉතිරිවීම් සිදුව තිබූ බව. | ක්‍රියාකාරී සැලැස්මේ වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතුය. |